# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2064/25 - 2018 මාර්තු මස 28 වැනි බදාදා - 2018.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වැනි වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2018 මාර්තු මස 22 වැනි දින.

**උපලේඛනය**

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 480 වැලිපිල්ලෑව ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ වැලිපිල්ලෑව ග්‍රාමයේ පිහිටියා වූ ද, පුවක්ගහදෙනිය කුඹුර නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 4236 හා 2004.07.16 දිනැති පිඹුරෙහි කැබලි අංක 12 සහ 13 ලෙස පහත සඳහන් මායිම් සහිත ප්‍රමාණයෙන් පර්චස් 20.75 ක් වූ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අඩි 20 පාර සඳහා වෙන්කල කැබලි අංක $R_1$ කොටස ; |
| *නැගෙනහිරට* | : | ඩී. ඒ. ගයන්තිකා පෙරේරා හිමිකම් කියන කැබලි අංක 11 කොටස ; |
| *දකුණට* | : | අඩි 10 පාර ; |
| *බටහිරට* | : | ඩී. ඩිලානි ජසින්තා ප්‍රනාන්දු හිමිකම් කියන කැබලි අංක 14 කොටස. |

*හිමිකම් කියන අය* : වරුණ යසස් ඇඹුල්දෙනිය මහතා

04 - 463


1A - G 27373 — 17 (2018/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*